මහ කොළඹ නාගරික ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතියේ (පිටත වටරවුම් මහාමාර්ග ව්‍යාපෘතිය) I අදියරේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මෙම ව්‍යාපෘතිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රී.ලං.ර.) සහ ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය (ජ.ජා.ස.නි.) අතර 2011 පෙබරවාරි 20 දින එළඹි ගිවිසුමක් යටතේ කොළඹ නගරයට පිටත වටරවුම් මාර්ගයක් ඉදිකිරීම පිළිබඳ විස්තරාත්මක සැලැසුම් අධ්‍යයනයක් කිරීම සඳහා ජපන් යෙන් මිලියන 580 කට සමාන රු. මිලියන 417 ක ප්‍රදානයක් ලැබීමෙන් මූලිකව ආරම්භ කරන ලදී. 2007 මාර්තු 28 දින එවකට ජාත්‍යන්තර සහයෝගීතාව පිළිබඳ ජපන් බැංකුව (JBIC) සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) අතර කොට්ටාව සිට කඩුවෙල (අදියර 01) දක්වා කිලෝමීටර් 11 ක මහාමාර්ගය ඉදිකිරීම සඳහා අංක එස්එල්-පී 89 දරන ණය ගිවිසුමට එළඹෙන ලදී. අනතුරුව, කඩුවෙල සිට කඩවත දක්වා (අදියර II) කිලෝමීටර් 8.9 ක් වූ මහාමාර්ගය ඉදිකිරීම සඳහා 2008 ජූලි 29 දින සහ 2011 මාර්තු 22 දින ශ්‍රී ලංකා රජය සහ ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය (ජ.ජා.ස.නි.) සමඟ පිළිවෙලින් ගිවිසුම් දෙකකට (එස්එල්-පී 91 සහ එස්එල් - පී 101) එළඹෙන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, මූල්‍යායනය සහ ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුම්වලට අනුව, මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යාංශය (ම.ව.නා.අ.) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, මාර්ග සංවර්ධන අධිකාරිය (මා.සං.අ.) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණු වන්නේ ;

(අ) කොළඹ ප්‍රධාන නගරයේ ප්‍රවාහන තදබදය අඩු කිරිමට හා රටේ අනෙකුත් ප්‍රදේශවලට සම්බන්ධතාවය වැඩිදියුණු කිරීම සඳහා දක්ෂිණ අධිවේගී මාර්ගයට සහ කොළඹ නගරයෙන් පිටතට යන අනෙකුත් ජාතික මාර්ගවලට සම්බන්ධ කෙරෙන හා කොළඹ අවට ප්‍රදේශ යාකෙරෙන අධිවේගී මාර්ගයක් ඉදිකිරීම.

(ආ) ශ්‍රී ලංකාවේ අනෙකුත් ප්‍රදේශවල ආර්ථික සංවර්ධනය ශක්තිමත් කිරීමට දායක වෙමින් ප්‍රධාන මාර්ගවලට සහ දක්ෂිණ අධිවේගී මාර්ගයට සම්බන්ධ කෙරෙන කොළඹ අවට ප්‍රදේශ යා කෙරෙන මහාමාර්ගයක් ඉදිකිරීම මගින් අවට ප්‍රදේශවල සම්බන්ධතාවය වැඩිදියුණු කිරීම සඳහා කොළඹ ප්‍රධාන නගරයේ ප්‍රවාහන තදබදය අවම කිරීම.

ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 72,924 ක් වූ අතර, ඉන් ජපන් යෙන් මිලියන 46,974 කට සමාන රු. මිලියන 52,007 ක් මූල්‍යායනය කිරීමට ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය එකඟවී තිබුණි. අදියර I යටතේ මහාමාර්ගයේ ඉදිකිරීම් වැඩ ආරම්භ කිරීම 2008 මැයි මාසයට නියමවී තිබූ අතර, මාස 48 ක් ඇතුළත 2012 අප්‍රේල් වන විට නිම කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, කොන්ත්‍රාත්තුව 2009 ඔක්තෝබර් 22 දින ප්‍රදානය කරන ලද අතර, 2013 වර්ෂය වන විට මාස 42 ක් ඇතුළත කිලෝමීටර් 11 ක් පමණක් නිම කිරීමට අපේක්ෂා කර තිබුණි. තවද, අදියර II යටතේ මහාමාර්ගය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව 2009 ඔක්තෝබර් 22 දින වෙනත් කොන්ත්‍රාත්කරුවකුට ප්‍රදානය කරන ලද අතර, 2013 දෙසැම්බර් 23 දින වන විට මාස 36 ක් ඇතුළත නිම කිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේ වෙතත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් කරන ලද ඉල්ලීමක් මත, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද 2012 අප්‍රේල් 25 දිනැති ලිපිය ප්‍රකාරව මෙම කොටස වෙනම ඒකකයක් ලෙස සලකා 2011 සැප්තැම්බර් 05 දින සිට බලපැවැත්වෙන පරිදි වෙනම ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් යටතේ මෙහෙයවන ලදී. කොට්ටාව සිට කඩුවෙල කොටස (අදියර I) 2014 මාර්තු 08 දින නිම කර ප්‍රවාහනය සඳහා විවෘත කරන ලදී.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම හා යොදා ගැනීමත් අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. විගණන විෂය පථය සහ මතය සඳහා පදනම

-----------------------------------------------

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මඟින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන, ගනුදෙනු, වත්කම්, වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂාකිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය දෙන ලද නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම, මූල්‍ය සහ භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් හා වගකීම්, ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඇ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුම්වල නියම කරන ලද පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඈ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඉ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව.

(ඊ) මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන පිළියෙල කර තිබුණේද යන බව.

(උ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණේද යන බව.

(ඌ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූලව කටයුතු කර තිබුණේද යන බව.

**3. මතය**
-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 05 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැරුණු විට මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව.

(ඇ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂයන් 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළදී එම ගිණුමින් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව.

(ඈ) ඉකුත් වර්ෂයේ මාගේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව සහ,

(ඉ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූලව කටයුතු කර තිබුණු බවත්ය.

**4. මූල්‍ය ප්‍රකාශන**
-----------------

**4.1 මූල්‍ය කාර්යසාධනය**
------------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ ලබාගත හැකි වූ තොරතුරු අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම රු. මිලියන 8,136 ක් වූ අතර, 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු. මිලියන 25,631 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වියදම, ඉකුත් වර්ෂය සඳහා වියදම සහ 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| විස්තරය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ දරන ලද වියදම | | 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | 2013 | 2012 | රු. |
| | රු. | රු. | |
| දේපල, පිරියත හා උපකරණ | 853,446 | 1,880,728 | 195,601,601 |

| | | | |
|---|---|---|---|
| ව්‍යාපෘති කළමනාකරණය | 735,312,127 | 765,433,941 | 3,428,752,172 |
| ඉඩම් සහ ඉඩම් වැඩිදියුණු කිරීම | 300,716,035 | (766,217,867) | 2,719,629,115 |
| සිවිල් වැඩ | 6,819,882,450 | 3,696,031,011 | 18,124,183,068 |
| උපදේශක සේවා | 273,997,833 | 219,668,901 | 1,143,384,710 |
| පර්යේෂණ, සංවර්ධන හා වෙනත් පිරිවැය | 5,560,897 | (166,365) | 19,751,990 |
| | ------------------ | ------------------ | ------------------ |
| එකතුව | 8,136,322,788 | 3,916,630,349 | 25,631,302,656 |
| | =========== | =========== | =========== |

## 5. විගණන නිරීක්ෂණ

### 5.1.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව, ණය අංක එස්එල්පී - 89 යටතේ වියපැහැදම් කළ මුළු අරමුදල් ප්‍රමාණය රු.3,342,223,619 ක් ලෙස දක්වා තිබුණි. කෙසේ වෙතත්, ඊට අනුරූපව ශේෂ පත්‍රයෙහි පෙන්වා තිබුණු මුදල රු.3,218,959,948 කි. වෙනස වූ රු.123,263,671 සඳහා හේතු විගණනයට පැහැදිලි කර නොතිබුණි.

(ආ) අතුරු ගෙවීම් සහතික අංක 23 හා 24 අනුව කොන්ත්‍රාත්කරුවන්ට රු.587,973,996 ක් ගෙවිය යුතු වූ අතර, ලෙජර් ගිණුම අනුව එය රු.554,694,447 ක් විය. වෙනස වූ රු.33,279,549 සඳහා හේතු විගණනයට පැහැදිලි කර නොතිබුණි.

(ඇ) උපදේශක සේවා සහ සිවිල් වැඩ පිළිබඳ කොන්ත්‍රාත් ගිවිසුම්වලට අනුව, මෝටර් වාහන, උපකරණ, ලිබඩු යනාදී ව්‍යාපෘති අරමුදල්වලින් කොන්ත්‍රාත්කරු මිලදී ගත් වත්කම් ව්‍යාපාතියේ දේපල වේ. කෙසේ වෙතත්, කොන්ත්‍රාත්කරු ඉදිරිපත් කළ අතුරු ගෙවීම් සහතික මඟින් මිලදීගත් වත්කම්වලින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා තිබුණේ රු.27,291,475 ක් වටිනා වත්කම් පමණක් බව නිරීක්ෂණය විය.

(ඈ) සාවද්‍ය ගණනය කිරීම් හේතු කොටගෙන පවරාගත් ඉඩම් සඳහා වන්දි ගෙවීමේදී රු.600,000 ක වැඩිපුර ගෙවීමක් කර තිබුණි.

(ඉ) මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන චක්‍රලේඛයේ 8.3.9 වගන්තියේ සඳහන් උපදෙස්වලට පටහැනිව 2013 දෙසැම්බර් 31 දින වනවිට රු.141,741,679 ක් මාර්ග සංවර්ධන අධිකාරියට පොදුකාර්ය ගාස්තු ලෙස ප්‍රේෂණය කර තිබුණි.

### 5.1.2 නොසැසඳූ පාලන ගිණුම්

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතිය විසින් මාර්ග සංවර්ධන අධිකාරිය සමඟ පවත්වාගෙන යනු ලැබූ ජංගම ගිණුමේ 2013 දෙසැම්බර් 31 දිනට රු.2,468,490 ක ගෙවිය යුතු ශේෂයක් දක්වා තිබුණි. කෙසේ වෙතත්, මාර්ග සංවර්ධන අධිකාරිය විසින් පවත්වාගෙන යනු ලැබූ අනුරූපී ජංගම ගිණුමේ එදිනට ශේෂය රු.10,602,815 ක් ලෙස දක්වා තිබුණි. වෙනස හඳුනාගෙන තිබූ නමුත් ගිණුම්වල අවශ්‍ය ගැලපීම් සිදු කර නොතිබුණි.

(ආ) ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලැබූ ජංගම ගිණුමේ දැක්වුණු රු.647,225,985 ක ශේෂය, පිටත වටරවුම් මහාමාර්ග ව්‍යාපෘතියේ (අදියර II) ජංගම ගිණුමේ දැක්වුණු රු.646,654,827 ක ශේෂය සමඟ නොසැසඳුනි. වෙනස වූ රු.571,158 හඳුනාගෙන තිබූ නමුත් අදාළ ගිණුම්වල එය ගලපා නොතිබුණි.

(ඇ) ව්‍යාපාතිය විසින් පවත්වාගෙන යනු ලැබූ ණය ගිණුම අනුව 2013 දෙසැම්බර් 31 දිනට වියපැහැදම් කළ ණය මුදල රු.3,218,959,948 ක් ලෙස දක්වා තිබුණු අතර, ඒ හා සම්බන්ධව මහා භාණ්ඩාගාරය පවත්වාගෙන ගිය ගිණුමේ ශේෂය රු.3,284,007,431 ක් ලෙස දැක්වුණි. රු.65,047,483 ක් වූ හඳුනාගත් වෙනස අදාළ ගිණුම්වල ගලපා නොතිබුණි.

## 6. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 6.1 අරමුදල් උපයෝජනය

මූල්‍ය ප්‍රකාශන සහ ලබා ගත හැකි වූ තොරතුරු අනුව, ව්‍යාපෘති මූල්‍යායනය, අයවැය ප්‍රතිපාදන සහ සමාලෝචිත වර්ෂය අවසානයට අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කීහිපයක් පහත දැක්වේ.

| ණය මුදල | ණය ගිවිසුම් අනුව මූල්‍යායනය සඳහා එකඟවූ මුදල | | 2013 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කළ අරමුදල් | |
|---|---|---|---|---|
| | ජපන් යෙන් මිලියන | රු. මිලියන | ජපන් යෙන් මිලියන | රු. මිලියන |
| ණය අංක පී-89 | 21,917 | 24,547 | 26,167 | 21,806 |
| ණය අංක පී-91 | - | - | 14 | 12 |
| ණය අංක පී-101 | - | - | 147 | 123 |
| ශ්‍රීලංර | 8,920 | 8,109 | 7,382 | 6,152 |
| | 30,837 | 32,656 | 33,710 | 28,093* |

* උපචිත වියදම් ඇතුළත් නොකිරීම හේතුකොටගෙන මෙම මුදල, මෙම වාර්තාවේ 4.1 ඡේදයේ දැක්වෙන මුදලට වඩා වෙනස් වේ.

### 6.2 භෞතික කාර්යසාධනය

#### 6.2.1 අධිවේගී මාර්ගයේ I අදියරේ භෞතික ප්‍රගතිය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතියේ ප්‍රගති වාර්තා අනුව, සමාලෝචිත වර්ෂය සඳහා සියයට 100 ක ප්‍රගතියක් ඉලක්ක කර තිබුණද සියයට 90 ක තථ්‍ය ප්‍රගතියක් ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කරගෙන තිබුණි. ඒ අනුව ඉලක්කයට වඩා තථ්‍ය ප්‍රගතිය සියයට 10 ක පසුබෑමක් පෙන්නුම් කෙරුණි. අධිවේගී මාර්ගයේ කිලෝමීටර් 27 + 560 සිට කිලෝමීටර් 18 + 100 දක්වාත් කිලෝමීටර් 18 + 100 සිට කිලෝමීටර් 17 + 500 දක්වාත් ඉදිකිරීම් වැඩ සඳහා කාලය දීර්ඝ කිරීම් අනුමත කර තිබුණි.

**6.2.2 කොන්ත්‍රාත් පරිපාලනය**

**-----------------------------**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2012 අගෝස්තු මස අංක 2/2012 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය පරිදි සියළුම ප්‍රසම්පාදන සඳහා වූ ඇස්තමේන්තු, ප්‍රසම්පාදන මුළු පිරිවැයෙහි නිරවද්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා වූ සියළුම කරුණු සැලකිල්ලට ගෙන සකස් කළ යුතුය. කෙසේ වෙතත්, විචලන නියෝග 83 කට අදාළව රු.2,891,143,073 ක සිවිල් වැඩ පිරිවැය ආරම්භක ඇස්තමේන්තුවලට ඇතුළත් කර තිබූ අතර, රු.52,947,744 ක වෙනත් විචලන නියෝග 3 ක් ආරම්භක ඇස්තමේන්තුවලින් ඉවත් කර තිබුණු බව නිරීක්ෂණය විය. මෙම තත්ත්වය ව්‍යාපෘතියේ මතභේද රාශියක් ඇතිවීමට සහ ව්‍යාපෘතියට අවාසි සහගත බලපෑම් ඇති වීමටද හේතු විය හැකිය. තවද, මෙවැනි විෂය පථ විචලනයන් සඳහා අමාත්‍ය මණ්ඩලය පත්කළ ටෙන්ඩර් මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ආ) මහාමාර්ග සඳහා හඳුන්වා දුන් අන්තර් හුවමාරු සමඟ වැඩවල විෂය පථය වෙනස්වීම හේතුවෙන් මුළු කොන්ත්‍රාත් පිරිවැය සියයට 20 කින් වැඩිවී තිබුණු බව නිරීක්ෂණය විය.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මහාමාර්ගයේ මුල් සැලැස්මේ ඇතුළත් නොවූ අතුරුගිරිය අන්තර් හුවමාරුව ව්‍යාපෘතියේ අදියර I යටතේ ඉදිකර තිබුණි. මෙම ඉදිකිරීම එම කොන්ත්‍රාත්කරුටම වෙනම කොන්ත්‍රාත්තුවක් ලෙස ප්‍රදානය කර තිබුණි. කෙසේ වෙතත් එම කාර්යය සඳහා කොන්ත්‍රාත් ගිවිසුමක් අත්සන් කර නොතිබුණි. 2012 අගෝස්තු මස අංක 2/2012 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 2 ඡේදය ප්‍රකාරව, රු.2,077,069,589 ක් පිරිවැය වූ අතුරුගිරිය අන්තර් හුවමාරුව ඉදිකිරීම් සඳහා රේඛීය අමාත්‍යාංශ ලේකම්වරයාගේ නිර්දේශ ලබාගෙන නොතිබුණි.

(ii) තවද, ආරම්භක අදියරේදී ඇස්තමේන්තු නොකළ උප කොන්ත්‍රාත්කරුවකු විසින් ඉටුකළ පදික මග ඉදිකිරීම් වැඩ හා අතුරුගිරිය අන්තර් හුවමාරුවේ මතුපිට පෙරමුසු මිශ්‍රණය ඇතිරීමේ කොන්ත්‍රාත් වැඩ සඳහා කොන්ත්‍රාත් කොන්දේසිවල අංක 59.1 වගන්තිය ප්‍රකාරව කොන්ත්‍රාත්කරු විසින් ව්‍යාපෘතියේ කැමැත්ත ලබාගෙන නොතිබුණි. විචලන නියෝගයක් යටතේ පිරිවැය රු.11,067,453 ක් ඉල්ලුම්කර තිබුණි.

(iii) මහාමාර්ග අදියර II යටතේ කොතලාවල අන්තර් හුවමාරුවේ ඉදිකිරීම් වැඩ සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, ස්ථිර අන්තර් හුවමාරුවෙහි ඉදිකිරීම් වැඩ ප්‍රමාදවීම හේතුකොටගෙන රු.84,657,425 ක පිරිවැයකට තාවකාලික අන්තර් හුවමාරුවක් ඉදි කර තිබූ අතර එම මුදල මහාමාර්ගයේ අදියර I හි පිරිවැයට අයකර තිබුණි. කොතලාවල තාවකාලික අන්තර් හුවමාරුව ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව 2013 නොවැම්බර් 13 දින රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට ප්‍රදානය කර තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ අනුමැතියකින් තොරව එකී වැඩ උප කොන්ත්‍රාත්කරුවකු විසින් සිදු කර තිබුණි.

(iv) කොට්ටාව අන්තර් හුවමාරුවේ ඉදිකිරීම් වැඩ දක්ෂිණ අධිවේගී මාර්ගයේ (STDP) වැඩ ආරම්භ කිරීමට පෙර නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, ස්ථිර අන්තර් හුවමාරුවේ ඉදිකිරීම් වැඩ ප්‍රමාද වීම හේතුවෙන් ව්‍යාපෘතිය විසින් විචලන නියෝගයක් මත රු.258,918,579 ක පිරිවැයකට තාවකාලික අන්තර් හුවමාරුවක් ඉදිකර තිබුණි. ආරම්භක අදියරේදී ව්‍යාපෘතිය ස්ථිර අන්තර් හුවමාරුව මනාව

සැලසුම් කළේ නම් තාවකාලික අන්තර් හුවමාරුවට දැරූ වියදම ඉතිරි කර ගත හැකිව තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, තාවකාලික අන්තර් හුවමාරුව ව්‍යාපෘතිය විසින් කඩා දමා රු.928,993,187 ක පිරිවැයකට නව ස්ථිර අන්තර් හුවමාරුව ඉදිකර තිබුණි. තවද, කොන්ත්‍රාත් කොන්දේසි අනුව ස්ථිර අන්තර් හුවමාරුව මාස 24 ක් ඇතුළත නිම කිරීමට අවශ්‍ය වුවත්, මාස 36 කට පසුව නිම කර තිබුණි. මේ සම්බන්ධයෙන් වූ රු. මිලියන 16.91 ක ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණි. මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යාංශයේ ලේකම්ගේ පැහැදිලි කිරීමට අනුව, ස්ථිර අන්තර් හුවමාරුවේ ඉදිකිරීම් වැඩ ප්‍රමාද වුවත් තාවකාලික අන්තර් හුවමාරුව ඉදිකළ නිසා ආදායම අහිමිවීමකින් තොරව මාර්ග සංවර්ධන අධිකාරියට මහාමාර්ගය මෙහෙයවීමට හැකියාව ලැබුණු හෙයින් ප්‍රමාද ගාස්තු අත්හැර දැමූ බව දක්වා තිබුණි.

(ඈ) ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවේ කොන්දේසි අනුව, කොන්ත්‍රාත්කරු මාර්ග ඉදිකිරීම් කාර්යය සඳහා තත්ත්ව සහතික පද්ධතිය අනුගමනය කළ යුතුය. එබැවින් කොන්ත්‍රාත්කරු තත්ත්ව සහතික කාර්ය මණ්ඩලය සැලසුම් කර සේවයේ යෙදවිය යුතුය. කෙසේ වෙතත්, එකී අවශ්‍යතාවයට කොන්ත්‍රාත්කරු අනුකූල නොවූ බව නිරීක්ෂණය විය. එබැවින් ව්‍යාපෘතියේ උපදේශක විසින් තත්ත්ව සහතික කාර්යයන් සඳහා අතිරේක කාර්ය මණ්ඩලයක් පත්කර ඒ සඳහා විචලන නියෝගයක් මඟින් රු.7,258,126 ක මුදලක් ඉල්ලුම් කර තිබුණි.

(ඇ) මහාමාර්ගයේ නඩත්තුවට වැදගත් වන අනනුකූල නිෂ්පාදන නිවේදන (NCPN) 13 ක් 2012 ජූලි සිට 2013 දෙසැම්බර් දක්වා උපදේශක විසින් නිකුත් කර තිබූ බව නිරීක්ෂණය විය. එහෙත් එකී නිවේදනවල සඳහන් අවශ්‍යතා නිවැරදි කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ඉ) කොන්ත්‍රාත් කොන්දේසිවල 14.2 වගන්තියට අනුව, වැඩ නිම කිරීම සඳහා කාලය දීර්ඝ කිරීම් අනුමත කිරීමේදි කොන්ත්‍රාත්කරු විසින් වැඩසටහන සංශෝධනය කිරීම අවශ්‍ය වේ. කෙසේ වෙතත්, කිලෝමීටර් 17+500 සිට 27+560 දක්වා වැඩ නිමකිරීමට සංශෝධිත වැඩසටහනක් කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කර නොමැති බව නිරීක්ෂණය විය.

(ඊ) කොන්ත්‍රාත් කොන්දේසිවල 56.1 වගන්තියට අනුව කොන්ත්‍රාත්තුවේ ඉංජිනේරු විසින් තථ්‍ය වැඩ නිමකිරීම් පිළිබඳ මිනුම් සහතික කළ යුතුය. කෙසේ වෙතත්, අංශ තුනක කරන ලද වැඩ සඳහා රු.68,703,786 ක වැඩිපුර ගෙවීමක් කර තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය. මාස තුනකට වැඩි කාලයක් කොන්ත්‍රාත්කරුට අතිරේක මූල්‍ය වාසියක් සලසමින් එම වැඩිපුර ගෙවීම මාස තුනකට පසු ආපසු අයකරගෙන තිබුණි.

(උ) ප්‍රමාණ පත්‍රයේ අනුමත කරන ලද පරිදි මතුපිට ඇතිරීම සඳහා පෙරමුසු (asphalt) කොන්ක්‍රීට් ටොන් එකක් සඳහා රු.14,161 ක රේටයක් වුවද, විචලනයට හේතු පැහැදිලි කිරීමෙන් තොරව කොන්ත්‍රාත්කරුගේ ගෙවීම් කිරීම සඳහා ටොන් 1 ක් රු.17,701 ක් ලෙස යොදා ගෙන තිබුණි.

(ඌ) පිරිවිතර ක්‍රමය ප්‍රකාශනයේ 406.3 (ඉ) අනුව මතුපිට පෙරමුසු මිශ්‍රණය විධිමත්ව තද කිරීම (Compaction of asphalt concrete wearing course) මඟින් ඇතිරිය යුතු නමුත් උපදේශක විසින් සේවයේ යෙදවූ ද්‍රව්‍ය ඉංජිනේරු විසින් ඉදිරිපත් කරන ලද වාර්තා සැලකිල්ලට ගැනීමෙන් තොරව අවස්ථා 6 කදී බාල ප්‍රමිති ආරක්ෂිත ද්‍රව්‍ය යෙදීම වෙනුවෙන් ගෙවා තිබූ බව නිරීක්ෂණය විය.

(එ) කොන්ත්‍රාත් කොන්දේසිවල 62.2 වගන්තියෙහි සඳහන් කර ඇති පරිදි, රු. මිලියන 200 ඉක්මවන අන්තර් ගෙවීම් සහතික තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් සැලකිල්ලට ගත යුතුය. කෙසේ වෙතත්, රු.මිලියන 200 ඉක්ම නොවූ අන්තර් ගෙවීම් සහතික 06 ක් ඇගයීම් කර තිබුණි.

(ඒ) මාර්ගය භාවිතා කරන්නන්ගේ ආරක්ෂාවට නුසුදුසු බවට හෙළිවීම හේතුකොටගෙන මහාමාර්ගයේ උරහිස්වල ඉදිකිරීම් සඳහා ආරම්භක සැලැස්ම අනුව ඇතිරූ ඇස්පල්ට් පසුව ඉවත්කර තිබුණි. එබැවින් රු.1,391,365 ක් පිරිවැය වූ ඇතිරූ ඇස්පල්ට් ටොන් 2,279 ක් පසුව ඉවත් කරන ලදී. මේ සඳහා රු.48,677,164 ක් පිරිවැය වූ නව ඇස්පල්ට් ආවරණයක් ඇතිරූ අතර, ඒ සඳහා විධිමත් අනුමැතියකින් තොරව විචලන නියෝගයක් යටතේ ගෙවීම් කර තිබුණි.

### 6.2.4 ව්‍යාපෘතියේ ඉඩම් පවරා ගැනීම් සහ යළි පදිංචි කිරීමේ කටයුතු

---

මූල්‍ය ප්‍රකාශන අනුව, ව්‍යාපෘති කාර්යයන් නිසා අවතැන් වූ පුද්ගලයන් යළි පදිංචි කිරීම සඳහා 2013 දෙසැම්බර් 31 දින දක්වා හෙක්ටයාර් 7.5691 ක් වූ ඉඩම් 06 ක් පවරා ගැනීම සඳහා ව්‍යාපෘතිය රු. මිලියන 2,719.6 ක් වැයකර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතියේ ඉඩම් පවරා ගැනීමේ සහ යළි පදිංචි කරවීමේ කටයුතු 2011 දෙසැම්බර් අවසානය වන විට නිමකිරීමට අපේක්ෂා කර තිබුණු බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, මහා මාර්ගයේ I වැනි අදියරේ ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු සියයට 99 ක් ද යළි පදිංචි කිරීමේ කටයුතු සියයට 70 ක්ද 2013 දෙසැම්බර් 31 දින වනවිට නිමකර තිබුණි.

(ආ) ඉඩම් පවරාගැනීමේ කටයුතු කඩිනම් කිරීම සඳහා රු.13,472,204 ක ප්‍රසාද දීමනා ගෙවා තිබූ නමුත් ඉඩම් පවරා ගැනීම් සඳහා වන්දි ගෙවීම් ප්‍රමාදවීම හේතුකොට ගෙන පොලී වශයෙන් එකතුව රු.174,492,185 ක් 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය විසින් දරා තිබුණි.

(ඇ) අවතැන්වූ පුද්ගලයන් යළි පදිංචි කරවීම සඳහා 2009 වර්ෂයේදී ව්‍යාපෘතිය විසින් රු.71,815,877 ක පිරිවැයකට කඩුවෙලින් පර්චස් 324.17 ක ඉඩමක් අත්පත් කරගෙන තිබුණි. පසුව ඉඩම් සංවර්ධන කටයුතු සඳහා ද රු.2,890,781 ක් වැය කර තිබුණි. පවරාගත් ඉඩම, කැබලි 21 කට කොටස් කර එයින් කොටස් 10 ක් අවතැන් වූ පුද්ගලයින්ට භාර දීමට කටයුතු කිරීමෙන් තොරව 2013 දෙසැම්බර් 31 දක්වාත් නිශ්කාර්යව පැවතුණි.

### 6.2.5 මානව සම්පත් කළමනාකරණය

---

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලබා ගත හැකි වූ තොරතුරු අනුව, ව්‍යාපෘතියේ කළමනාකරණ ඒකකයට තනතුරු 24 ක් සඳහා 56 දෙනෙකු පත්කිරීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමැතිය ලබාදී තිබුණි. කෙසේවෙතත්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත නොකළ කළමනාකරණ සහකාර තිදෙනෙකු, දේශීය උපදේශකවරුන් සිවු දෙනෙකු, නැවත පදිංචිකිරීමේ උපදේශකයකු, සැලසුම් උපදේශකයකු සහ ප්‍රවාහන පද්ධති විශ්ලේෂකයෙකු පත්කර සමාලෝචිත වර්ෂය තුළදී රු.7,736,364 ක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි.

(ආ) 2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව ව්‍යාපෘතියට කාර්යමණ්ඩලය බඳවාගත යුතුය. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ව්‍යාපෘතියේ කාර්යමණ්ඩලය අනුමත කර තිබූ නමුත්, එකී කාර්යමණ්ඩලයෙන් බැහැරව විධිමත් අනුමැතිය ලබා ගැනීමෙන් තොරව කළමනාකරණ සහකාරවරුන් තිදෙනෙකු පත්කර සමාලෝචිත වර්ෂයේදී රු.1,316,507 ක පාරිශ්‍රමික ගෙවා තිබුණි.

(ඇ) 2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 2.2.4 සහ 2.2.7 ඡේදයන් අනුව පත්වීම් කළ යුත්තේ ජාතික පුවත්පත්වල නිවේදන පළකර අයදුම්පත් කැඳවීමෙන් වසර තුනකට නොවැඩි කාලයකට කොන්ත්‍රාත් පදනම මතවේ

කෙසේවෙතත්, එකී විධිවිධානවලට පටහැනිව මාර්ග සංවර්ධන අධිකාරියෙන් මුදා හරින ලද නිලධාරීන්ගෙන් සමන්විත ව්‍යාපෘති කාර්යමණ්ඩලයේ සියළුම සමාජිකයින් තාවකාලික පදනම මත පත්කර තිබුණි.

(ඈ) ව්‍යාපෘතියට අනුයුක්ත කරන ලද මාර්ග සංවර්ධන අධිකාරියේ සේවකයින්ගේ වැටුප්, 2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛයට පටහැනිව මාර්ග සංවර්ධන අධිකාරිය විසින් හඳුන්වා දෙන ලද සූත්‍රයක් භාවිතා කර ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් එකී උපදෙස් අනුගමනය කිරීමෙන් තොරව 2013 දෙසැම්බර් 31 දින දක්වා රු.208,796,395 ක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි.

(ඉ) ව්‍යාපෘතියට අනුයුක්ත කරන ලද මාර්ග සංවර්ධන අධිකාරියේ සේවකයින්ට ප්‍රසාද දීමනා, වෛද්‍ය දීමනා සහ මාර්ග සංවර්ධන අධිකාරියේ දීමනා සඳහා හිමිකම් නොමැති නමුත් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන චක්‍රලේඛයේ 8.3.9 සහ 8.6 වගන්තිවල විධිවිධානයන්ට පටහැනිව රු.3,405,403 ක් ප්‍රසාද දීමනා හා වෛද්‍ය දීමනා වශයෙන් ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය.

(ඊ) වර්ෂ 08 ක කාලපරිච්ඡේදය තුළදී ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන්, නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්, ඉංජිනේරුවන්, ගණකාධිකාරීවරුන්, පරිපාලන නිලධාරීන් සහ දේශීය උපදේශකයින් වැනි ව්‍යාපෘතියේ ප්‍රධාන තනතුරුවලට වරින්වර කාර්ය මණ්ඩලය පත්කර තිබුණි. ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වශයෙන් මාර්ග සංවර්ධන අධිකාරිය, පරිචයක් ලෙස එහි නිලධාරීන්, ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ අත්දැකීම් සපයා දීමට හා මූල්‍ය වාසි ලබාදීම සඳහා ව්‍යාපෘතියට අනුයුක්ත කළ බව විගණනයේදී නිරීක්ෂණය විය. එබැවින් ව්‍යාපෘති කාර්යයන් විධිමත්ව කරගෙන යාම, කාලීනව ක්‍රියාත්මක කිරීම සහ ආසන්න අධීක්ෂණය යන කරුණු කෙරෙහි අඩු ප්‍රමුඛතාවයක් දී තිබුණි.

(උ) බඳවාගැනීමේ පරිපාටිය අනුගමනය කිරීමකින් තොරව දේශීය උපදේශකයින් 4 දෙනෙකු පත්කර 2013 දෙසැම්බර් 31 දින දක්වා රු.642,423ක පාරිශ්‍රමික ගෙවා තිබුණි. වැඩ විස්තරය (Job Description) අනුව උපදේශකයින්ගේ නිමැවුම මැනිය හැකිවන පරිදි නියමිත රාජකාරි පවරා නොතිබුණි. එහෙත් ව්‍යාපෘතියේ වෙනත් මාණ්ඩලික නිලධාරීන් විසින් ඒ වන විටත් කර තිබූ වැඩ මෙම උපදේශකයින්ට පවරා තිබුණි. එබැවින්, එම උපදේශකයන්ගේ වාසි සහගත බලපෑම සහ දායකත්වය විගණනයේදී තහවුරු කරගත නොහැකි විය.

### 6.2.6 මෝටර් වාහන උපයෝජනය

ව්‍යාපෘතියේ වාහන පද්ධතිය සඳහා ව්‍යාපෘති අරමුදල්වලින් මිලදීගත් මෝටර් වාහන 2 කින්ද, කුලියට ගත් මෝටර් වාහන 9 කින්ද, මාර්ග සංවර්ධන අධිකාරියෙන් වෙන් කළ මෝටර් වාහනයකින්ද කොන්ත්‍රාත්කරු විසින් සපයන ලද මෝටර් වාහන 4 කින්ද සමන්විත විය. 2007 දෙසැම්බර් 20 දිනැති අංක 33(1) දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව මෝටර් වාහන පහසුකම් ලබා ගැනීමට හිමිකම් නැති නිලධාරීන්හට මෝටර් වාහන 8 ක් වෙන්කර දී තිබුණි.

### 6.2.7 මතභේදයට තුඩුදෙන කරුණු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතියේ අරමුණුවලට පටහැනිව රු.2,907,895 ක් වටිනා විචලන නියෝග විවිධ කරුණු සඳහා අනුමත කර තිබුණි.

(ආ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 ඡේදයේ සඳහන් උපදෙස්වලට පටහැනිව 2013 දෙසැම්බර් 31 දින දක්වා රු.14,741,679 ක් පොදුකාර්ය ලෙස මාර්ග සංවර්ධන අධිකාරියට ප්‍රේෂණය කර තිබුණි.

(ඇ) 2013 මාර්තු මාසයේ ජපානයේ පැවැත්වූ දින 20 ක වැඩමුළුවකට ඉංජිනේරුවරුන් 6 ක් සහභාගී වී තිබූ අතර ව්‍යාපෘතිය විසින් ඒ සඳහා රු.2,128,200 ක් ගෙවා තිබුණි. 2010 ජූලි 09 දිනැති ජනාධිපති ලේකම්ගේ අංක සීඒ/1/1/16/1 දරන චක්‍රලේඛය ප්‍රකාරව එම වැඩමුළුවට සහභාගීවූ නිලධාරීන් අදාළ වාර්තා ජනාධිපති ලේකම් වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ඈ) කිලෝමීටර් 18+002 සිට කිලෝමීටර් 18+110 කොටසේ 9,218 $m^3$ ප්‍රමාණයක සණ කළුගල් පුපුරවා ඉවත් කිරීම සඳහා කියුබික් මීටරයකට රු.18,696 ක රේට්යකට උප කොන්ත්‍රාත්කරුවකුට රු.172,339,728 ක් ගෙවා තිබුණි. තවද, කොන්ත්‍රාත්කරුට 920 $m^3$ ක් භාවිතා කිරීමට අවසරදී තිබුණු අතර, එයින් 143 $m^3$ භාවිතා කර තිබුණි. ඉතිරි කළුගල් ද්‍රව්‍ය භාවිතය හෝ විකිණීම හෝ අපහරණය පිළිබඳ තොරතුරු විගණනයට පැහැදිලි නොකරන ලදී.